කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය, 2016/2017

## INR 3267: ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය: 1977 සිට

කාලය: **පැය දෙකයි (02)**

**පළමු ප්‍රශ්නය** ඇතුළුව **ප්‍රශ්න තුනකට (03)** පිළිතුරු සපයන්න.

---

### පළමු කොටස

### අනිවාර්ය ප්‍රශ්නය

1. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙන් සුදුසු උදාහරණ භාවිත කරමින් පහත දැක්වෙන විදේශ ප්‍රතිපත්ති විශ්ලේෂණ (Foreign Policy Analysis: FPA) ක්‍රම විස්තර කරන්න.

   i. පාත්‍ර විශේෂී න්‍යායය (Actor Specific theory) (ලකුණු 10)

   ii. ඩේවිඩ් සිගර් ගේ මට්ටම් විශ්ලේෂණය (David Singer's levels of analysis) (ලකුණු 10)

---

### දෙවන කොටස

**ඕනෑම ප්‍රශ්න දෙකකට (02)** පිළිතුරු සපයන්න.

2. පහත අනුතේමා කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් කුඩා රාජ්‍යයක විදේශ ප්‍රතිපත්තිය සම්පාදනයේදී පද්ධතිමය සහ දේශීය සාධකවල වැදගත්කම විභාග කරන්න.

   i. ඉන්දු - ශ්‍රී ලංකා ද්විපාර්ශවික වෙළඳාම (ලකුණු 10)

   ii. චීන - ශ්‍රී ලංකා මුලෝපායික සම්බන්ධතා (China- Sri Lanka strategic relations) (ලකුණු 10)

3. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න

   i. "දැඩි නොබැඳිභාවය" (strict non-alignment) පැහැදිලි කරන්න. (ලකුණු 8)

   ii. ජේ.ආර්.ජයවර්ධන විදේශ ප්‍රතිපත්තියෙහි අර්ථික දිශානතිය (Economic orientation) සුදුසු උදාහරණ සඳහන් කරමින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

4. "නිරන්තරයෙන් විතැන් වන විදේශ ප්‍රතිපත්තියක් තිරසාර දේශපාලනික සම්බන්ධතා සහ ඒ ආශ්‍රිත ප්‍රතිලාභ සංවර්ධනය වළක්වයි." මෙම ප්‍රකාශයේ වලංගුභාවය ශ්‍රී ලංකාවේ දේශපාලනික තන්ත්‍ර දෙකක් ඇසුරෙන් අගයන්න. (ලකුණු 20)

5. **එක්කෝ**

   i. ශ්‍රී ලංකා සිවිල් යුද්ධයට නෝර්විජියානු මැදිහත්වීම සිදු වූ කාලයේ ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තියේ ගතිකයන් තක්සේරු කරන්න. (ලකුණු 20)

   **නැතහොත්**

   ii. ශ්‍රී ලංකා යුද්ධයේ අවසාන සමයේ විදේශ ප්‍රතිපත්තිමය අරමුණු ඉටුකර ගැනීමෙහිලා ජාත්‍යන්තර ප්‍රජාවේ කාර්යභාරය විචාරාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

6. "අද ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය" පිළිබඳ අදාල උදාහරණ සපයමින් රචනාවක් ලියන්න. (ලකුණු 20)

University of Colombo – Sri Lanka

Faculty of Arts

Third Year Examination in Arts – Semester II, 2016/2017

**INR 3267: Foreign Policy of Sri Lanka: Since 1977**

Duration: **Two (02) hours**

Answer **Three (03)** questions including question **number 1**.

---

**Part I**

**Compulsory question**

1. Using relevant examples describe the following Foreign Policy Analysis with special reference to the Sri Lankan Foreign Policy.
   i. Actor specific theory (10 marks)
   ii. David Singer's levels of analysis (10 marks)

---

**Part II**

**Answer any Two (02) questions**

2. Examine the importance of both systemic and domestic factors in formulating a foreign policy to a small state with special reference to the following sub themes;
   i. Indo-Sri Lanka bilateral trade (10 marks)
   ii. China Sri Lanka strategic linkages (10 marks)

3. Answer **both (02)** sections.
   i. Explain "strict non-alignment". (8 marks)
   ii. citing relevant examples, analyze the economic orientation of J.R. Jayewardene's foreign policy. (12 marks)

4. "A constantly shifting foreign policy prevents the development of sustainable political relations and their related benefits." Assess the validity of this statement using two political regimes in Sri Lanka. (20 marks)

5. **Either**
   i. Evaluate the dynamics of Sri Lanka's foreign policy during the period of Norwegian Intervention to the Sri Lankan Civil War. (20 marks)

   **Or**

   ii. Crucially analyze the role of the International Community when achieving foreign policy objectives of Sri Lanka during the latter part of the war? (20 marks)

6. Write an essay on "contemporary challenges to on the "Foreign Policy of Sri Lanka".(20 marks)

********************************